ක්කයේ වේයන්ගොඩ අසල මොට්ටුන්න නම් ගමේ පිහිටි කුඩාටැම්පිටවිහාරගේ එම භූමියේ අලුතෙන් පිළිමගෙයක් හා දගැබක් සාද ඇති නුමුත් අභාවයට යන්ට නැර පවත්වාගෙන යනවා (1959 වර්ෂය සඳහා පුරාවිද්‍යාකොමසාරිස්තැනගේ පාලන වාර්තාවේ 20 වෙනි පිට බලන්න).

## සැලසුම්

1. අම්බුලුගල ටැම්පිටවිහාරගෙය

   (1) උඩුමහල

   (2) හරහට පෙනෙන හැටි

   (3) බිම්සැලැස්ම

   (4) ඉදිරියට පෙනෙන හැටි

2. දෙරබාවිල ටැම්පිටවිහාරගෙය

   (1) හරහට පෙනෙන හැටි

   (2) ඉදිරියට පෙනෙන හැටි

   (3) බිම්සැලැස්ම

   (4) උඩුමහල

## අඳිනලද රූපය

අම්බුලුගල ගල්උලුවස්සෙන් සිංහරූපයක්.

## ඡායාරූප

1–3. අම්බුලුගල විහාරගේ: වර්ෂ 1950හේදී ගන්නා ලද ඡායාරූප

**ඡායාරූප 12— තලාකොලහේනේ ටැම්පිටවිහාරගේ**



රත්ගල්තලාව, හිරුසඳු, සිවුවරමුන්ගේ දෙව්ලෝ, වැනි දේ විය. මහෞෂධ පඬිතුමන්ගේ මේ උමං සිතියම්, සුප්‍රකට අජන්තාවේ විස්මය ජනක චිත්‍ර කර්ම ස්මරණයට ගෙන එයි.

භිත්තිගත චිත්‍රකර්මයන් (Wall Paintings) සඳහා සුධාලේපනයෙන් (Coated with Lime) පිරිමදින ලද බිත්ති තෝරා ගත්ට ඇත.

මූර්තිය චිත්‍රයට වඩා දුෂ්කර කලාකාරියකි. ත්‍රිධාවිස්තෘත මානය (Third Dimension) දැක්විය යුතු මූර්තියෙහි ලා කායික ශ්‍රමය ද කායච්ඡෙද විද්‍යාඥානය ද අතිරේක වශයෙන් අවශ්‍ය වෙයි. ඒ කෙසේ වුවද, ජාතක කථාවන්හි දැක්වෙන අයුරු චිත්‍ර කලාව තරම් ප්‍රචලිත නොවුවද සම කක්ෂයෙහි ලා ගිණිය යුතු තරමට මූර්ති කලාව ද ප්‍රගුණ කරණ ලද්දේ යැයි සිතිය හැකියයි. ජාතක සමාජයෙහි නිර්මිත වී යැයි ඒකාන්තයෙන් සැලකිය හැකි මූර්ති කලාත්මක නිෂ්පාදන පිළිබඳ නිදර්ශන අපට නොලැබිය හැකි බව සත්‍යයකි. එහෙත් භාරතීය මූර්ති ශිල්පියා ගේ කාර්යය ඉන්දු නිම්න ශිෂ්ටාචාරය තරම් පෞරාණික බව මොහෙන්-ජොදරෝ - හරප්පා ගවේෂණයන්ගෙන් පැහැදිලි වෙයි. මොහෙන්ජොදරෝ සහ ඉන්දු සභ්‍යත්වය පිළිබඳ ජෝන් මාර්ෂල් (John Marshall) වියතාණන් සවිස්තරව දක්වන කරුණු යම්තම් මෙනෙහි කිරීම වුවද මෙහි තත්වය තේරුම් ගැනීමට ප්‍රමාණවත්ය. සින්ධ (Sind) නිම්නයේ නෂ්ටාවශේෂ අඩු ගණනේ ක්‍රි: පූ: තෙවන හෝ සිව්වන සහශ්‍ර වර්ෂය (Third or Fourth Millennium B.C.) ද ඉක්මවා යන බව ආචාර්ය ආනන්ද කුමාරස්වාමි, තම ''භාරතීය සහ ඉන්දුනීසියානු කලා ඉතිහාසයේ ''සඳහන් කරයි.

භාරතීය කලාකාරයා රූ නෙලීම සඳහා මුලින් ම තෝරාගත් ද්‍රව්‍යය ලී බව පෙනී යයි. ශෛල සහ ලෝහ වර්ග ද තම කලා කෞශල්‍යය ප්‍රදර්ශනය කිරීම සඳහා උචිත බව ඔහු අනුක්‍රමයෙන් වටහා ගන්නට ඇත. ලීයෙන් මූර්ති නිර්මාණය කිරීමෙහිලා නිපුණයන් සිටි බව ජාතක කථා මගින් අනාවරණය වෙයි. අසාත මන්ත ජාතකයෙහි සඳහන් බ්‍රාහ්මණයා දිඹුල් ලීයෙන් පුරුෂ ප්‍රමාණ රූපයක් පිළියෙල කළ අයුරු දැක්වෙයි: කරණ්ඩක නම් ආශ්‍රම පදයෙහි හස්තියකුගේ ශෛලප්‍රතිමාවක් ගොඩනගා තිබුණු අයුරු ද සඳහන් ව ඇත. මෙය නිතැතින් ම අපේ සිහියට ගෙන එන්නේ, අශෝක ගේ ශිලා ලිපියක් ද දක්නට ඇති ධෞලියේ (ඔරිස්සා) සුප්‍රකට ශෛලමය හස්ති ප්‍රතිමාව යි. මහෞෂධ පඬිතුමන්ගේ උමඟ තුළ ඉදිවුණු රාජ මන්දිරයන්හි තබන ලද සුරූපී නාරි මූර්ති, ස්පර්ශ නොකරන තෙක් ම කිසිවකුට වත් අප්‍රාණික යැයි නොකිවහැකි විය. නිර්මාණයෙහි කලාත්මක අගය කෙබඳු දැයි අපට නිගමනය කළහැකි නොවෙතත්, ජාතක කථාවන්හි ස්වර්ණමය ප්‍රතිමා ගැන ද සඳහන් වේ. චිත්‍රකූටයන්ගෙන් (Decorated, Peaks) අලංකාර කරන ලද ඉන්ද්‍ර ප්‍රතිමාවන්ගෙන් වට කරගත් දෙර කොටුවක් (Gate House), පිළිබඳව ද සඳහන් වන ජාතක කථාවක් ඇත.

ඉහත සඳහන් පරිදි විවිධ ප්‍රතිමා ගැන සඳහන් වෙතත්, දේව ප්‍රතිමා එකල පැවැති බවට නිරනුමාන සාක්ෂ්‍ය ජාතක කථාවන්ගෙන් ලැබීම දුෂ්කර ය. එහෙත් නගරයෙන් බැහැර නොයෙක් විදියේ චෛත්‍ය, ථූප සහ දේවකුලයන් (Abodes of Gods) පැවැති බව සඳහන් වන හෙයින් යම් ආකාරයක දේව ප්‍රතිමා පැවැතිබවට ද සාධක නොලැබිය හැක්කේ ම නොවේ. ශතවර්ෂ කිහිපයකට අනතුරු ව මනා සංවර්ධනයකට පත් ව ඇති සාංචි, භාරුත් වැනි ස්ථාන ඉහත සඳහන් පූජනීය ස්ථානවල ක්‍රමානුකූල විකාශනයක් සේ සැලකීමට පුළුවන. ශිල්පීන්ගේ කලා කෞශල්‍යය එම ස්ථානයන්හි විදහා දක්වනු සඳහා තෝරා ගෙන ඇත්තේ ද ජාතක කථාවලින් ම නැගුණු විශිෂ්ට සිද්ධීන් ය.

මේ හැරුණු විට මූර්තිකලාවේ ප්‍රවීණතාව දක්වනු පිණිස ක්‍රීඩා භාණ්ඩ නිෂ්පාදනයද ප්‍රගුණ කළ බව සිහිපත් කරවන සිද්ධි ජාතක කථාවල අන්තර්ගත වේ. තේමිය කුමරුන් ඉදිරියේ ඔහුගේ ගොළු බව, අකර්මණ්‍ය බව විමසනු පිණිස තැබූ භාණ්ඩ අතර, ළදරුවන් ප්‍රිය කරන රන් ආදියෙන් කළ ඇත් රූ ආදියද වූ බව සඳහන් වේ.

ගෘහ නිර්මාණ කලාව පිළිබඳ ප්‍රමාණවත් දියුණුවක් ද ජාතක සමාජයෙහි පැවතිණැයි සිතවන සාක්ෂ්‍ය එතරම් දුර්ලභ නොවේ. ගෘහ, ග්‍රාම සහ නගර නිර්මාණ සම්බන්ධ තොරතුරු බොහෝ තැන්වල දැක්ක හැකියි. ජාතක කථාවල දක්නට ලැබෙන ශිල්පීන් අතර ''වාස්තුවිද්‍යාචාර්යයන්'' (Men qualified for testing sites for house building.) ද දක්නට ඇත. ඔවුන්ගේ කාර්යය ගෙවල් ඉදි කිරීමට යොග්‍ය ගෙබිම් විමසා බැලීමය. වාස්තු විද්‍යාඥයන්ගේ දිව්‍යමය ප්‍රතිමූර්තිය වන විශ්වකර්ම (Divine Architect පිළිබඳ සඳහන් කර තිබීමෙන් ද පෙනීයන්නේ ගෘහ නිර්මාණ කලාව පිළිබඳ පැවති සම්භාවනය යි.

ජාතක කථාවල එන සඳහන් අනුව, විශාල ශාලාවන් සහ රාජමන්දිරයන් එකල පැවැති බවට සැක කළ යුතු නොවේ. පුරාතන රාජගෘහ පුරයේ ගිරිවූජ ප්‍රාකාරය (Cyclopeau Wall) ජාතක කථාවන්හි නිතර සඳහන් වනු මෙන්ම, එහි ඇති පැරණි බවද සිහියට නංවයි. රතිවද්ධන පාසාද, පුප්ඵක පාසාද යනුවෙන් හැඳින්වෙන විශේෂ ප්‍රාසාද දෙකක් ඇත. මෙයින් පළමුවැන්න

කාමීන්ගේ ප්‍රීතිමත් ජීවිතයට අවශ්‍ය අංගයන්ගෙන් අනූනව පිළියෙල වන්නට ඇත. දෙවැන්න විවිධ පුෂ්පාලඞ්කාරයන්ගෙන් විභූෂිත මන්දිරයක් වන්නට ඇත. තවත් තැනෙක සඳහන් වන ''අයෝසරය'' සැදුණේ යකඩයෙනි. එය කාරාගෘහ, විශේෂයක් වන්නට පුළුවන. ඒකථූනක නම් ප්‍රාසාදයක් පිළිබඳව ද සඳහනක් දක්නට ඇත. එය නම් නිසැකයෙන්ම එක් ටැම් මාලිගාවක් (Palace on Single Pillar) වන්නට පුළුවන. වෛඩූර්‍ය්‍ය මාණික්‍යයෙන් නිර්මිත වූ දහසක් පමණ වූ අට පට්ටම් (Octagonal) ටැම්වලින් අලංකාර වූ විශාල මන්දිර ගැන ද කියැවේ. මේවායේ ඇති අතිශයෝක්තිය ඉවත් කළ විට සත්‍යය වටහා ගැනීම දුෂ්කර නොවේ.

ගෘහ නිර්මාණ කලාව හා සම්බන්ධ වන සංඥානාම කිහිපයක් පිළිබඳ විමසා බැලීමද අනුචිත නොවේ. ''කොට්ඨක'' යනුවෙන් හැඳින් වෙන්නේ දෙර කොටුවයි. එනම් වාසලයි. ගෙට ඇතුළු විය හැක්කේ එය ඉක්මවීමෙනි. ''කොට්ඨාගාර'' යනු කොටුගුලයි. ධාන්‍ය සහ වස්ත්‍ර සප්ත විධ රත්න යනාදිය කොටුගුල්වල තැන්පත් කොට තබන ලද බව පෙනී යයි. ''කූටාගාර'' යනුවෙන් හැඳින්වුනේ කූට සහිත වූ මන්දිරයි. මේ කූටය ඇතැම් විට කොත් කැරැල්ලක් සේ පිළියෙල වූවක් විය හැකියි. මුදුන් වැටියක් සහිත පියස්සකින් යුක්ත වූ ගෙයද ''කූටාගාර'' සේ සලකන ලද බව පෙනී යයි. බැවුම් සහිත වහලවලින් යුත් ජනේලය හෝ අට්ටාලයක් වැනිව පිළියෙල වුණු මතු මහල් තලයක කොටස හෝ පඤ්ජර නාමයෙන් ගැනිණි. සිංහාකෘතියද දක්වෙන සේ ඉහත සඳහන් පරිදි පිළියෙල කල ජනේලයක් ගැන බොහෝ ජාතක කථාවල සඳහන් වේ. රජුන්, නගරය දෙසද රැස්වුණු මහජනයා දෙසද බලන්නේ සීහපඤ්ජර කවාටයෙනි. ගෝපානසීන් (Bent Rafters) සම්බන්ධ කොට තිබුණේ කර්ණිකාවෙහි ය. ගෘහයක හෝ ශාලාවක හෝ මේ ප්‍රධාන අංගයක් කොට සැලකුණු බව පෙනේ. ගෙතුළ සිට උඩ බැලීමෙන් මෙය දක්ක හැකිය. කර්ණිකාව අලංකාර කැටයමකින් සැදුනකි. යටිකුරු කළ පද්මයක ආකෘතිය මේ සඳහා යොදගත් බව පෙනේ. පියුම් පෙති සම්බන්ධ වන කෙමිය ද හැඳින්වෙන්නේ ''පද්ම කර්ණිකා'' යන නාමයෙන්ය.

යාන්ත්‍රික විද්‍යාවේ මහ අපූරුවක් සේ සැලකිය යුතු පෘථුවි ගර්භයෙහි කළ විචිත්‍ර ගොඩනැගිල්ලක් වූ මහෞෂධ පඬිවරයා ගේ මහා උම්මග්ගය (Creat Tunnel) ගෘහ නිර්මාණ කලා සාකච්ඡාවක දී අමතක කළ නොහැක්කකි. ඒ පිළිබඳව මහා උම්මග්ග ජාතකයෙහි එන විස්තරය අද්භූතයක් නොව තාත්වික ස්වරූපය සිහිගන්වන්නකි. එම උමං මුව පිහිටියේ ගංගා නදී කූලයෙහි (Bank) ය. උමගෙයි ප්‍රවේශද්වාරය නගරයෙහි විය. යාන්ත්‍රික ක්‍රියා කාරීත්වයෙන් යුත් අටලොස් රියන් උස මහ දෙරටුවකින් එය සැදි තිබිණි. එක් ඇණයක් (Peg) මිරිකාලන්නා ම සියල්ල වැසී යෙයි. උමගේ දෙපස ගඩොළුයෙන් බඳිනු ලැබ සුධාකර්මයෙන් ආලේපනය කරන ලද්දේ විය. උමගේ මතු තලය පුවරු අතුරා බදමයෙන් තිර කොට සුදු පාටින් නිම කොට පැවතිණි. උමහය ඇතුළත ප්‍රධාන දෙරටු සොළසකි. අප්‍රධාන දෙරටු සූසැටකි. ඒ සියල්ල ද යාන්ත්‍රික ක්‍රියා කාරීත්වයෙන් යුක්ත හෙයින් ඇණ මිරිකනු හා ම ඇරෙන්නේ ද වෙයි. වැසෙන්නේ ද වෙයි.

උමහ දෙපස එක්සිය එකක් පමණ වූ රජුන් පිණිස ඉදිවුණු ''සයනගබ්භයන්'' එම ගණනේම වුණු බව කියැ වේ. මේ සයන ගබ්භ නම් නිදන මැදිරියයි. ධවලච්ඡත්‍ර නැංවූ පර්‍ය්‍යඞ්කයක් ද විය. මෙම පර්‍ය්‍යඞ්කය අසලම වූයේ සුරූපී ලලනාවක් පසෙකින් සිටගත් සිංහාසනයකි. උමහ දෙපස විචිත්‍ර චිත්‍රයෙන් සැරසී තිබිණි. මෙය ඉහතින් ද සඳහන් වී ඇත. උමංබිම සුදු වැල්ලෙන් ඇතුරුණු රිදී පටක් මෙන් විය. උමං වහල පිපුණු රත් පියුමින් අලංකාර විය: උමහ දෙපසම තන්හි තන්හි හැදුණු ආපන ශාලාවන්ගෙන් ගහණව තිබිණි. එමෙන්ම ඔබ මොබ සුගන්ධවාසිත කුසුමයෙන් සැදුණු පූර්ණඝට විය. මෙලෙසින් සැදුණු උමහ සක් දෙවිඳුගේ සුධර්මා සභාව වැනි විය.

ප්‍රාග් - බෞද්ධ යුගයේ පටන් පැවතෙන මෙබඳු කලා සම්ප්‍රදයක මාර්ග දේශකත්වය අජන්තා ඇල්ලෝරා වැනි ගුහා නිර්මාණයේ දී මූලාධාර විනැයි අනුමාන කළහැක. ජෛනයන් ගේ ආචාරඞ්ග සූත්‍රය ද මිහිගැබ වූ ඉදිවුණු මන්දිර ගැන සඳහන් කරයි. ඒ කෙසේ වුවද, ආගමික නොවන ගෘහ නිර්මාණ කලාවේ ප්‍රාග් - බෞද්ධ තත්වය වටහා ගැනීමට උම්මග්ග ජාතකයේ උමං විස්තරය මඳවිසින් හෝ උපස්තම්භක නොවෙතැයි අපට ඉවත ලිය නොහැක.

ජාතක කථාවල ආගමික ගෘහ නිර්මාණයේ මූලික අවස්ථාවන් පිළිබිඹු වෙතැයි කිව හැක. ''දේවකුල'' නමින් බොහෝ තැන්වල සඳහන් වන්නේ නිසැකයෙන්ම ආගමික ආයතනයන් විය හැකි වුවත් ඒවායේ ස්වභාවය හෝ නිර්මාණ විධිය පිළිබඳ කිසිම තොරතුරක් දැන ගැනීමට අපට ක්‍රමයක් නැත. මෙම දේවකුල විවිධ සංචාරකයන්ගේ විශ්‍රාම ස්ථාන වශයෙන් පරිහරණය කෙරුණු බව නම් නිතර නිතර සඳහන් වේ. එහෙයින් මනුෂ්‍ය වාසයට ද යෝග්‍ය වන පරිදි පිළියෙලවුණු ගොඩනැගිලි මේ ස්ථානයන්හි පැවති